**<u>ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019(2022)</u>**

ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.11.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක PA/HRD-03/52/2022 සඳහා ලද අංක අමප/22/1784/605/011-I හා 2022.11.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2022.04.24 දිනැතිව පවත්වන ලද උක්ත තරග විභාගයෙහි සියලු විෂයයන්ට පෙනී සිට එක් එක් විෂයයට සියයට හතලිහකට (40%) නොඅඩුව ලබා සමත් වූ අයදුම්කරුවන්ගේ මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල මත, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇතුළත් වන පරිදි සකස් කරන ලද විභාග කොමසාරිස් ජනරාල්ගේ 2022.10.12 දිනැති ලිපිය මගින් මා වෙත යොමු කරන ලද ප්‍රතිඵල ලේඛනයට අනුව පහත නම් සඳහන් නිලධාරින් ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා දීම වෙනුවෙන් වන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා 2022 දෙසැම්බර් මස 16 දින කැඳවීමට තීරණය කර ඇත.

02. මෙම ප්‍රතිඵල ලේඛනයේ නම සඳහන් වීම පමණක් මත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකමක් නොවන බව අවධාරණය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී මූලික අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට නියමිතය. මෙම බඳවා ගැනීම අංක 2024/35 හා 2017/06/21 දිනැති ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන සහ අංක 2186 දරන 2020.07.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද උක්ත තරග විභාග නිවේදනය සහ අංක 2225 දරන 2021.04.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද එම විභාග නිවේදන සංශෝධනය ප්‍රකාරව සිදු කෙරේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්